# 10

# විදේශ මුල්‍ය

# ශ්‍රී ලංකා ආර්ථිකයට බලපාන ආකාරය

# මෙම පාඩම යටතේ

01. ගෙවුම් ශේෂ ලේඛනය
02. ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ ලේඛනයේ අසමතුලිතා
03. විදේශ සම්පත් පරතරය හා විදේශ වත්කම් වල ආනයන ශඛ්‍යතාව
04. විදේශ ආයෝජන රටකට බලපාන අකාරය
05. විදේශ විනිමය අනුපාතිකය තිරණය වන අකාරය
06. විදේශ විනිමය අනුපාතික ක්‍රම
07. විනිමය අනුපාතිකය වෙනස්වීම හා එහි ප්‍රතිවිපාක
08. බහු පාර්ශවීය මුල්‍ය ආයතන වල කාර්ය විමසයි

යන කොටස් අධ්‍යයනය කෙරේ.

# 01. ගෙවුම් ශේෂ ලේඛනය

**කිසියම් නිශ්චිත කාලපරිච්ඡේදයක් තුල රටක නේවාසිකයන් හා අනේවාසිකන් අතර සිදුවන සියලුම ආර්ථික ගණුදෙණු සාරාංශ කොට දක්වනු ලබන සංඛ්‍යානමය වර්ථාව ගෙවුම් තුලන ලේඛනයයි.**

- ලෝකයේ සෑම රටක්ම සම්මත ක්‍රමවේදයක් ඔස්සේ ගෙවුම් තුලන ලේඛනය සකස් කරනු ලබයි මෙම සම්මත ක්‍රමවේදය ඉදිරිපත් කරනු ලබන්නේ ජත්‍යන්තර මූල්‍ය අරමුදල මගිනි. ආර්ථිකයේ හටගන්නා විවිධ කාලීන වෙනස්කම් වලට අනුව සංශෝධනය කරමින් මෙම ක්‍රමය සකසනු ලබන අතර අවසන් වරට නිකුත් කල සංසකරණය ලෙස 2009 වසරේ ඉදිරිපත් කල BPM 6 අකෘතිය දක්විය හැකිය

- ශ්‍රී ලංකාව මෙම ක්‍රමය 2013 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරමින් ගෙවුම් ශේෂ ලේඛනය සකස් කරයි.

# ගෙවුම් තුලන ලේඛනයේ සංරචක

- ජංගම ගිණුම
- ප්‍රාග්ධන ගිණුම
- මූල්‍ය ගිණුම

## ජංගම ගිණුම

යම් කාලපරිච්ඡේදයක් තුළ රටක නේවාසිකයන් හා අනේවාසිකයන් අතර සිදුවන භාණ්ඩ හා සේවා ගණුදෙණු, ප්‍රාථමික ආදායම් ආශ්‍රිත ගණුදෙණු, ද්විතීක ආදායම් ආශ්‍රිත ගණුදෙණු සටහන් කරන ගිණුමයි.

ජංගම ගිණුමේ ප්‍රධාන සංරචක 03 කි.

- භාණ්ඩ හා සේවා ගිණුම
- ප්‍රාථමික ආදායම් ගිණුම
- ද්විතික ආදායම් ගිණුම

# භාණ්ඩ හා සේවා ගිණුම

නිෂ්පාදන ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස බිහි වන ද සම්බන්ධයෙන් ආශ්‍රිතව නේවාසිකයන් හා අනේවාසිකයන් අතර සිදුවන ගණුදෙණු වර්ථා කරන ගිණුමයි. මෙම ගිණුම නැවත කොටස් දෙකකට වෙන් කෙරේ.

## 01. භාණ්ඩ ගිණුම

දෘශ්‍ය භාණ්ඩ ආනයන හා අපනයන ආශ්‍රිත ගණුදෙණු හා මුල්‍ය නොවන රත්‍රන් ආශ්‍රිත ගණුදෙණු සටහන් කරන ගිණුමයි. මෙම ගිණුමේ ශේෂය වෙළෙඳ ශේෂය ලෙසද නම් කරයි.

## 02. සේවා ගිණුම

නිෂ්පාදන ක්‍රියාකාරකම් වල ප්‍රතිඵළයක් ලෙස බිහි වු අදෘශ්‍ය සේවා ආනයන හා අපනයන ආශ්‍රිත ගණුදෙණු මෙහි සටහන් කෙරේ.

ප්‍රවාහන සේවා / සන්නිවේදන සේවා /ඉදිකිරීම් සේවා /රක්ෂණ සේවා /ආණ්ඩුවේ වියදම්

මෙම ගිණුම් දෙකෙහි ශේෂය හෙවත් භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂයට ශුද්ධ අපනයන ලෙස නම් කෙරේ.

# ප්‍රාථමික ආදායම් ගිණුම

ප්‍රාථමික ආදායම් ගණයට ඇතුලත් වන්නේ නිෂ්පාදන ක්‍රියාවලිය ආශ්‍රයෙන් පැන නගින විවිධ ආදායම් වේ. මෙම අදායම් පහත පරිදි දැක්විය හැකිය.

- නිෂ්පාදන ක්‍රියාවලිය ආශ්‍රයෙන් පැන නගින ආදායම් වන වැටුප්
- නිෂ්පාදනය මත අයකරන හා ලබාදෙන බදු හා සහනාධාර
- මුල්‍ය වත්කම් හා ආයෝජන ආශ්‍රයෙන් හට ගන්නා පොළී
- ප්‍රති ආයෝජන ඉපයීම්
- ලාභාංශ
- නිෂ්පාදනය නොකල මුල්‍ය නොවන ස්වභාවික ද බදු දීමෙන් උපයාගනු ලබන බදු කුලි
- පුරස්කාර, සන්නම්, ස්වාධිකාර, වරලත් බලපත්‍ර, ආශ්‍රයෙන් උපයනු ලබන ආදායම්

# ද්වීතික ආදායම් ගිණුම

ද්වීතීක ආදායම් ගිණුම යනු නේවාසිකයන් හා අනේවාසිකයන් අතර සිදුවන රාජ්‍ය හා පෞද්ගලික ජංගම සංක්‍රාම ඇතුලත් කරන ගිණුමයි. මෙහි ඇතුලත් කරන ගණුදෙණු වන්නේ

- සේවා නියුක්තියන්ගේ ප්‍රේෂණ
- රජයේ ජංගම සංක්‍රාම

# ප්‍රාග්ධන ගිණුම

නේවාසිකයා හා අනේවාසිකයන් අතර ප්‍රාග්ධන සංක්‍රාම ලැබීම් හා ගෙවීම් ද නිෂ්පාදනය නොකල මූල්‍ය නොවන වත්කම් අත්පත් කරගැනීම් හා බැහැර කිරීම් ද සඳහන් කරන ගිණුමයි.

- නේවාසිකයන් සහ අනේවාසිකයන් අතර සිදුවන ප්‍රාග්ධන සංක්‍රාම ලැබීම් සහ ගෙවීම්
- නිෂ්පාදනය නොකල මූල්‍ය වත්කම් අත්පත් කරගැනීම හා බැහැර කිරීම්
- ප්‍රාග්ධන සම්පාදන අරමුණින් සම්පත් ඒක පාර්ශවිය ලබාදීම් හෝ ලබා ගැනීම්
- ආණ්ඩු හෝ ජත්‍යන්තර ආයතන විසින් මුදල් හෝ ද්‍රව්‍යමය වශයෙන් ලබාදෙන ප්‍රාග්ධන ප්‍රධානයන්

# මූල්‍ය ගිණුම

නේවාසිකයන් හා අනේවාසිකයන් අතර සිදුවන මූල්‍ය වත්කම් හා වගකීම් ආශ්‍රිත ගණුදෙණු මූල්‍ය ගිණුමෙහි වර්ථා කෙරේ. මූල්‍ය ගණුදෙණු වල කාර්‍යාත්මක ස්වරූපය මත මූල්‍ය ගිණුම උප ගිණුම් 05 කින් සමන්විත වේ.

- සෘජු ආයෝජන
- කළඹ ආයෝජන
- මූල්‍ය ව්‍යුත්පන්න
- අනෙකුත් ආයෝජන
- සංචිත වත්කම්

# වැරදීම් හා අත්හැරීම්

ගෙවුම් ශේෂ ලේඛනයක සියලු ගනුදෙනු ද්විත්ව සටහන් ක්‍රමය අනුගමනය කරමින් වාර්තා කරන බැවින් හර අගයන්ගේ එකතුව බැර අගයන්ගේ එකතුවට සමාන විය යුතු බැවින් ගෙවුම් ශේෂය අනිවාර්යයෙන්ම තුලනය විය යුතුයි

මේ නිසා අවසාන වශයෙන් ඉතිරි වන කිසියම් නොගැලපීමක් වැරදි හා අත්හැරීම ලෙස සලකා ගෙවුම් ශේෂය තුලනය කරනු ලැබේ

# සමස්ථ ශේෂය

කිසියම් කාලපරිච්ඡේදයකයක් තුළ දී ශුද්ධ විදේශ සංචිත තත්ත්වයේ වෙනස්වීම සමස්ත ශේෂය ලෙස හැඳින්වේ.නැතහොත් කිසියම් කාලපරිච්ඡේදයක් ආරම්භයේ ශුද්ධ විදේශ සංචිත හා එම කාලපරිච්ඡේදය අවසානයේ ශුද්ධ විදේශ සංචිත අතර වෙනස යි.

# ද්විත්ව සටහන් මුලධර්මයට ගෙවුම් තුලන ලේඛනය සැකසීම

ගෙවුම් තුළන ලේඛනයේදී එකම ගනුදෙණුව හර හා බැර වශයෙන් අවස්ථා දෙකක සටහන් කිරීම ද්විත්ව සටහන් මුල ධර්මයට අනුව ගෙවුම් තුළන ලේඛනය සැකසීම නම් වේ.

ගෙවුම් තුලන ලේඛනයේදී බැර වටිනාකම් (+) ලකුණක් සහිතවත් හර වටිනාකම් (-) ලකුණක් සහිතවත් වෙන වෙනම සටහන් කෙරේ.

- ඕනෑම අවස්ථාවක කිසියම් අයිතමයක් ( භාණ්ඩයක් / සේවාවක් / වත්කමක් ) තම රටින් වෙනත් රටකට අපනයනය කරනු ලබන විට එම අයිතමයේ වටිනාකම ගෙවුම් තුලන ලේඛනයේ බැර (+) වශයෙන් සටහන් කල යුතුය
- ඕනෑම අවස්ථාවක කිසියම් අයිතමයක් ( භාණ්ඩයක් / සේවාවක් / වත්කමක් ) තම රටට වෙනත් රටකින් ආනයනය කරනු ලබන විට එම අයිතමයේ වටිනාකම ගෙවුම් තුලන ලේඛනයේ හර (-) වශයෙන් සටහන් කල යුතුය

# ගෙවුම් තුලන ලේඛනයක අන්තර්ගත වන ගණුදෙනු වර්ග

## 01. භාණ්ඩ හා සේවා අපනයන කිරීම හා ආනයනය කිරීමට අදාල ගනුදෙණු

**භාණ්ඩ හා සේවා අපනයන ගණුදෙණු**

ශ්‍රී ලංකාවේ තේ තොගයක් රුසියාවට අපනයනය කිරීම

ජංගම ගිණුම - භාණ්ඩ ගිණුම අපනයන ශිර්ෂය බැර

මුල්‍ය ගිණුම - මුදල් හා තැම්පතු ශිර්ෂය හර

**භාණ්ඩ හා සේවා ආනයන ගණුදෙණු**

සහල් තොගයක් ඉන්දියාවෙන් ආනයන කිරීම

මුල්‍ය ගිණුම - මුදල් හා තැම්පතු ශිර්ෂය බැර

ජංගම ගිණුම - භාණ්ඩ ගිණුම අපනයන ශිර්ෂය හර

## 02. ආදායම් ලැබීම් හා ගෙවීම් අශ්‍රිත ගණුදෙණු

**ආදායම් ලැබීම් ආශ්‍රිත ගණුදෙණු**

විදේශ රටක සමාගමක් හරහා ශ්‍රී ලංකාව ලාභාංශ ලැබීම

ජංගම ගිණුම ප්‍රාථමික ආදායම් ශිර්ෂය බැර

මුල්‍ය ගිණුම මුදල් හා තැම්පතු ශිර්ෂය හර

**ආදායම් ගෙවීම් ආශ්‍රිත ගණුදෙණු**

විදේශ රටකින් ලබාගත් ණය සඳහා පොලී ගෙවීම

මුල්‍ය ගිණුම මුදල් හා තැම්පතු ශිර්ෂය බැර

ජංගම ගිණුම ප්‍රාථමික අදායම් ගිණුම හර

## 03. වත්කම්, ධනය, තෑග්ග වැනි දෑ පිළිබඳ කෙරෙන ඒක පාර්ශවීය ගණුදෙණු

**ඒකපාර්ශවීය ලැබීම් ආශ්‍රිත ගණුදෙණු**

විදෙස් රටක සේවය කරන පුද්ගලයෙක් මෙරටට මුදල් ඒවීම

ජංගම ගිණුම ද්වීතීක ආදායම් ශිර්ෂය බැර

මූල්‍ය ගිණුම මුදල් හා තැම්පතු ශිර්ෂය හර

## 04. මූල්‍ය වත්කම් හිමිකර ගැනීම හා විකිණීම අශ්‍රිත ගණුදෙණු

**මූල්‍ය වත්කම් වැඩිවීම**

ලංකවේ සමාගමක් විදේශ සමාගමක කොටස් මිලදීගැනීම

මූල්‍ය ගිණුම මුදල් හා තැම්පතු ශිර්ෂය බැර

මූල්‍ය ගිණුම අනිකුත් ආයෝජන ශිර්ෂය හර

**මූල්‍ය වත්කම් අඩු වීම**

ශ්‍රි ලංකා රජයේ බැදුම්කර විදේශ සමාගමක් මිලදී ගැනීම

මූල්‍ය ගිණුම -කළඹ ආයෝජන- සුරැකුම්පත් ශිර්ෂය බැර

මූල්‍ය ගිණුම මුදල් හා තැම්පතු ශිර්ෂය හර

## 05. නිෂ්පාදනය නොකල මූල්‍ය නොවන වත්කම් හිමිකර ගැනීම හා විකිණීම ආශ්‍රිත ගණුදෙණු

**නිෂ්පාදනය නොකල මූල්‍ය නොවන වත්කම් හිමිකර ගැනීම**

විදේශ සමාගමක වෙළෙඳ ලකුණු යටතේ ගණුදෙණු කිරීමේ අයිතිය ලබා ගැනීම

මූල්‍ය ගිණුම අනිකුත් ආයෝජන බැර

ප්‍රාග්ධන ගිණුම හර

**නිෂ්පාදනය නොකල මූල්‍ය නොවන වත්කම් විකිණීම**

ශ්‍රි ලංකාවේ රචිත පොතක ප්‍රකාශන අයිතිය විදේශ සමාගමකින් මිලදී ගැනීම

ප්‍රාග්ධන ගිණුම බැර

මූල්‍ය ගිණුම මුදල් හා තැම්පතු හර

# 02. ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ ලේඛනයේ අසමතුලිතා

## මෑත වර්ෂවල ජංගම ගිණුමේ ලක්ෂණ

| වසර | වෙළෙඳ ගිණුමේ ශේෂය | සේවා ගිණුමේ ශේෂය | ප්‍රාථමික ආදායම් ගිණුම | ද්විතියික ආදායම් ගිණුම | ජංගම ගිණුම |
|---|---|---|---|---|---|
| **2016** | -8873 | 2879 | -2202 | 6453 | -1742 |
| **2017** | -9619 | 3338 | -2355 | 6327 | -2309 |
| **2018** | -10343 | 3966 | -2389 | 6163 | -2814 |
| **2019** | -7997 | 2879 | -2426 | 5776 | -1808 |
| **2020** | -6008 | 819 | -2205 | 6207 | -1187 |
| **2021** | -8139 | 1586 | -2018 | 5228 | -3343 |

## ජංගම ගිණුමේ හිඟය අඩුකර ගැනීමට ඉදිරිපත් කරන යෝජනා

- නවාංතා හඳුන්වාදීම මගින් විවිධාංගිකරණය කිරීම
- ආනයනික වෙළෙඳපොළෙවල් පුළුල් කර ගැනීම
- මුදලේ විදේශ අගය ස්ථාවර කර ගැනීම
- ආහාර හා රෙදිපිලි ආනයනය සීමා කර ඒ සඳහා ආදේශක ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම
- ගෝලීය තරඟකාරිත්වය ඉහල නැංවීම

# මෑත වර්ෂවල ජංගම හා ප්‍රාග්ධන ගිණුමේ ලක්ෂණ

| | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|---|
| ජංගම ගිණුම් ශේෂය | -1742 | -2309 | -2814 | -1808 | -1187 | -3343 |
| ප්‍රාග්ධන ගිණුමේ ශේෂය | 25 | 11 | 14 | 23 | 28 | 25 |
| ජංගම හා ප්‍රාග්ධන ගිණුමේ ශේෂය | -1717 | -2298 | -2799 | -1785 | -1159 | -3318 |

## ජංගම හා ප්‍රාග්ධන ගිණුමේ අතිරික්තයක ප්‍රතිවිපාක

- විදේශ සංචිත වත්කම් ඉහළ යාම
- ආනයන සඳහා විදේශ සංචිත ප්‍රමාණවත් වන කාලය දීර්ඝ වීම.
- මුදල් සැපයුම කෙරෙහි ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති වීම හා එමගින් උද්ධමනාත්මක බලපෑම තීව්‍රවීම
- විදේශ විනිමය අනුපාතිකයේ අගය ඉහළ යාම

## ජංගම හා ප්‍රාග්ධන ගිණුමේ හිඟයක ප්‍රතිවිපාක

- විදේශ සංචිත වත්කම් පහළ යාම
- ආනයන සඳහා විදේශ සංචිත ප්‍රමාණවත් වන කාලය අඩු වීම
- මුදල් සැපයුම කෙරෙහි සංකෝචණාත්මක බලපෑමක් ඇති වීම
- විදේශ විනිමය අනුපාතිකයේ අගය පහළ යාම

# කෙටි කාලීන ගෙවුම් තුලන හිඟ පියවීමේ ක්‍රියාමාර්ග

- විදේශ සංචිත යොදා ගැනීම
- ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් අධාර ගැනීම
- වෙනත් ජාත්‍යන්තර මූල්‍ය ආයතන වලින් කෙටි කාලීන ණය ලබා ගැනීම
- අරක්ෂණවාදී ක්‍රියාමාර්ග කරා යොමු වීම

# දිගු කාලීන ගෙවුම් තුලන හිඟ පියවීමේ ක්‍රියාමාර්ග

- අපනයන විවිධාංගීකරණය
- සම්ප්‍රදායික නොවන අපනයන දිරිමත් කිරීම
- අපනයන ප්‍රවර්ධන කලාප පිහිටුවීම
- විදේශ රටවල් සමග වෙළෙඳ ගිවිසුම් වලට එළඹීම
- ආනයන ආදේශන කර්මාන්ත දියුණු කිරීම
- අනවශ්‍ය නොවන ආනයන අධෛර්‍යමත් කිරීම

# 03. විදේශ සම්පත් පරතරය හා විදේශ වත්කම් වල ආනයන ශඛ්‍යතාව

## විදේශ සම්පත් පරතරය

විදේශ සම්පත් පරතරය යන්නෙන් අදහස් කරන්නේ විදේශ ලැබීම් හා ගෙවීම් අතර වෙනසයි

විදේශ සම්පත් පරතරය = විදේශ ලැබීම් - විදේශ ගෙවීම්

### විදේශ ලැබීම්

- අපනයන ලැබීම්
- සේවා ඉපයීම්
- ප්‍රාථමික ආදායම්
- වර්ථන පෞද්ගලික ද්වීතීක අදායම්

### විදේශ ගෙවීම්

- ආනයන
- සේවා ගෙවීම්
- සාධක ආදායම් ගෙවීම්
- වර්ථන පෞද්ගලික සංක්‍රාම ගෙවීම්
- පෞද්ගලික ප්‍රාග්ධන සංක්‍රාම
- ප්‍රාග්ධනය ආපසු ගෙවීම්
- ආයෝජනය පිටතට ගලා යාම්
- වාණිජ බැංකු මුල්‍ය වත්කම් අත්පත් කර ගැනීම

# විදේශ වත්කම් වල ආනයන ශබ්‍යතාව

රටක මුල්‍ය අධිකාරිය සතු එමගින් පාලනය කරනු ලබන විදේශ ගෙවීම් ඌණතාවයන් පියවීම සඳහා සෘජුවම යොදා ගත හැකි විදේශ විනිමය අනුපාතිකයේ අගය රැකීම සඳහා යොදා ගත හැකි සහ වෙනත් කාර්‍යයන්ට අවශ්‍ය විනිමය මධ්‍යයන් විදේශ වත්කම ලෙස හැදින්වේ.

## විදේශ වත්කම් වල සංයුතිය

- මහ බැංකුව සතු විදේශ තැම්පතු
- මහ බැංකුව මිලදී ගත් විදේශ සුරැකුම්පත්
- ශ්‍රී ලංකා රජය සතු විශේෂ ගැණුම් හිමිකම්
- වාණිජ බැංකු සතු විදේශ ව්‍යාවහාර මුදල්
- වානිජ බැංකු මිලදී ගත් විදේශ සුරැකුම්පත්

## විදේශ වත්කම් පවත්වා ගැනීම රටකට වැදගත් වන අකාරය

- මුදලේ විදේශ අගය ස්ථාවරව පවත්වාගෙන යාමට
- මුදල් සැපයුම තිරණය කිරීමට
- මුල්‍ය අධිකාරියට විදේශ වෙළෙඳපොළට බලපෑම් කිරිමේ හැකියාව තිරණය කිරීමට
- ආනයන ශබ්‍යතාව පිරික්සීමට
- ගෙවුම් ශේෂ හිගය පියවීමට

## විදේශ වත්කම් වල ආනයන ශක්‍යතාවය

යම් වර්ෂයක් අවසානයේ පවත්නා විදේශ වත්කම් වල ප්‍රමාණය ආනයන වියදම් පියවා ගැනීමට යෙදවුවහොත් කොපමණ මාස ගණනකට එයින් ගෙවීම් කල හැකිද යන්නයි.

ආනයන ශක්‍යතාවය = දළ විදේශ වත්කම් / ඉදිරි වර්ෂයේ ඇස්තමේන්තුගත මාසික  ආනයන වියදම

# 04. විදේශ ආයෝජන රටකට බලපාන අකාරය

රටක් ව්‍යාපාර ආයතනයක් හෝ පුද්ගලයෙක් වෙනත් රටක මුල්‍ය වත්කම් මිලදී ගැනීම හෝ නව ව්‍යාපාර බිහිකරීම හෝ පවත්නා ව්‍යාපාර වල කොටස් වැඩි සංඛ්‍යාවක් මිලදී ගැනීම විදේශ ආයෝජනයයි. විදේශ ආයෝජනය ප්‍රධාන කොටස් දෙකකි

## 01. ඍජු විදේශ ආයෝජන

විදේශ ඍජු ආයෝජන යනු කිසියම් ප්‍රතිලාභයක් අපේක්ෂාවෙන් විදේශ ආයෝජකයින් විසින් මූර්ත වත්කම් අත්පත් කර ගැනීමයි.සාමාන්‍යයෙන් ශ්‍රී ලාංකික සමාගමක ඡන්දය බලය සහිත මූලික කොටස් හිමිකම් වලින් සියයට 10 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් අනේවාසිකයින් විසින් මිලදී ගනු ලැබීම ඍජු ආයෝජනයක් ලෙස සැලකේ.

### ඍජු ආයෝජනයේ හිතකර ප්‍රතිවිපාක

- දේශීය ප්‍රාග්ධන සම්පාදනය වැඩිවීම
- ආර්ථික වෘද්ධිය වේගවත් වීම
- රැකියා අවස්ථා සහ නව වෙළෙඳ පොළ අවස්ථා බිහිවීම
- යටිතල පහසුකම් සංවර්ධනය වීම
- විදේශීය වෙළෙඳ පොළවල් කරා ළඟාවීමට හැකි වීම
- අපනයන විවිධාංගීකරණය වීම

## සෘජු ආයෝජනයේ අහිතකර ප්‍රතිවිපාක

- දේශීය කර්මාන්ත පිරිහීම
- දේශීය ව්‍යාපාරිකයන්ට මුදල් වෙළෙඳ පොළේ තෙරපුම් ප්‍රතිවිපාකයට මුහුණ පෑමට සිදුවීම
- ආර්ථිකය පිළිබඳ කිසියම් පාලනයක් විදේශිකයන් අතට පත්වීම.
- අභ්‍යන්තර දේශපාලන කටයුතු වලට මැදිහත් වීම.
- ලාභ හා ලාභාංශ ලෙස දේශීය සම්පත් පිට රටවලට ඇදී යාම නිසා ගෙවුම් ශේෂයට අහිතකර බලපෑම් ඇතිවිය හැකි වීම
- විදේශ ආයෝජන ඉවත්කර ගැනීමේ අවදානමක් පවතින බැවින් ආර්ථිකය තුළ ස්ථාවරත්වයක් ඇති වීම

## 02. කළඹ ආයෝජන

මූල්‍යමය ප්‍රතිලාභයක් අපේක්ෂාවෙන් විදේශීය ආයෝජකයින් විසින් මිල දී ගනු ලබන ව්‍යාපාරික ආයතනවල කොටස්, මුදල් වෙළඳ පොළේ උපකරණ, පිළිණපත් සහ ණයකර යනාදියයි. මෙය කළඹ අයෝජනය යනුවෙන් ද හැඳින්වේ.

මෙමගින් අඩු අවදානම් සහිත ක්ෂේත්‍ර වල තම අරමුදල් ආයෝජනය කළ හැකි වීමෙන් ආයෝජකයින්ට වාසි සැලසෙන අතරම, ගෙවුම් ශේෂය හා විනිමය අනුපාතිකය ශක්තිමත් වීමෙන් ඒවා ලැබෙන රටවලට වාසි අත්වේ.

# 05. විදේශ විනිමය අනුපාතිකය තීරණය වන අකාරය

**සමනාය භාණ්ඩ හා සේවා වෙළෙඳපොළ මෙන් විනිමය ඉල්ලුම හා විනිමය සැපයුම මත සිදුවන සමතුලිතය විදේශ විනිමය අනුපාතිකය ලෙස හඳුනාගත හැකිය.**

## විදේශ විනිමය ඉල්ලුම

**නේවාසිකයින් විසින් අනේවාසිකයින් වෙත විදේශ විනිමය ගෙවීමක් සිදුකරන සෑම අවස්ථාවක දී ම විදේශ විනිමය සඳහා ඉල්ලුමක් ඇති වේ.**


උදා: භාණ්ඩ හා සේවා ආනයනය /ලාභාංශ ගෙවීම /ජංගම හා ප්‍රාග්ධන සංක්‍රාම ගෙවීම /විදේශ රටවල කෙරෙන ප්‍රාග්ධන ආයෝජන /විදේශයන්ගෙන් ලබාගෙන ඇති ණය සඳහා වාරික හා පොලී ගෙවීම

## විදේශ විනිමය සැපයුම

**අනේවාසිකයින් වෙතින් නේවාසිකයන් හට විදේශ විනිමය ලැබීමක් සිදු වන සෑම අවස්ථාවක දී ම විදේශ විනිමය සඳහා සැපයුමක් ඇති වේ.**

උදා. භාණ්ඩ හා සේවා අපනයන / විදේශ ණය හා ආධාර ලැබීම / විදේශ ආයෝජන සඳහා ලාභාංශ හා පොලී ලැබීම /විදේශ ආයෝජන ලැබීම /විදේශයන්ට සපයා ඇති ණය සඳහා වාරික හා පොලී ලැබීම / ජංගම හා ප්‍රාග්ධන සංක්‍රාම ලැබීම


# සෘජු ක්‍රමයට විනිමය අනුපාතිකය




**විදේශීය ව්‍යවහාර මුදල් ඒකකයක මිල,දේශීය ව්‍යවහාර මුදල් ඒකකවලින් ප්‍රකාශ කිරීම සෘජු කියවීම ලෙස හැඳින්වේ මෙමගින් විදේශ මුදල් ඒකකයක් සමග හුවමාරු වන දේශීය ව්‍යවහාර මුදල් ප්‍රමාණය දැක්වේ.**

නිදසුන. - එක්සත් ජන ජනපද ඩොලර් එකක් ශ්‍රී ලංකා රුපියල් 125

# වක්‍ර ක්‍රමයට විනිමය අනුපාතිකය




දේශීය ව්‍යවහාර මුදල් ඒකකයක මිල, විදේශ ව්‍යවහාර මුදලින් කොතරම් ද යන්න ප්‍රකාශ කිරීම වක්‍ර කියවීමේ ක්‍රමය ලෙස හැඳින්වේ. දිනය මෙය සෘජු කියවීමේ ක්‍රමයේ පරස්පරය වේ.

- **නිදසුන. - ශ්‍රී ලංකා රුපියල් 1 ක් එක්සත් ජන ජනපද ඩොලර් 0.01**

$$\text{දේශිය මුදලේ විදේශිය අගය} = \frac{1}{\text{විදේශිය මුදල් ඒකකයට හුවමාරු වන දේශිය මුදල් ඒකක ප්‍රමාණය}}$$

# 06. විදේශ විනිමය අනුපාතික ක්‍රම

ලෝකයේ සෑම රටක් ම නිශ්චිත විදේශ විනිමය අනුපාතික ක්‍රමයක් පවත්වා ගන්නා අතර එම රටේ විදේශ විනිමය අනුපාතිකය තීරණය වීම එම ක්‍රමය මත සිදුවේ. විනිමය අනුපාතික ක්‍රම /ත්‍රන්ත තුනක් පහතින් දැක්වේ ඒවා නම්,

## 01. පූර්ණ පාවෙන විනිමය අනුපාතික ක්‍රමය

පූර්ණ පාවෙන විනිමය අනුපාතිකය යනු විදේශ විනිමය වෙළෙඳපොලේ ඉල්ලුම් හා සැපයුම් මත මහ බැංකුවේ මැදිහත්වීමකින් තොරව විනිමය අනුපාතිකය තිරණය වීමේ ක්‍රමයයි.

## පූර්ණ පාවෙන විනිමය අනුපාතිකයේ වාසි

- බාහිර සමතුලිතතාව ඳකගැනීම සඳහා වෙහෙස වීම අවශ්‍ය නොවන නිසා ආර්ථික කළමනාකරණය පහසු වේ.
- ගෝලීය සම්පත් තරගකාරී භාවිතයන් අතර කාර්යක්ෂමව බෙදී යාම කෙරෙහි අදාල වීම
- විදේශ විනිමය වෙළෙඳපොළට මහ බැංකුවේ මැදිහත් වීම අවශ්‍ය නොවීම
- විනිමය අනුපාතිකය අධි තක්සේරු වීම හෝ ඌන තක්සේරුවීමක් අවශ්‍ය නොවීම
- නිල විනිමය විදේශ සංචිත විශාල ප්‍රමාණයක් අවශ්‍ය නොවීම හා එම සම්පත් වෙනත් ඵලදායි කටයුත්තක් සඳහා යොදාගත හැකි වීම

## පූර්ණ පාවෙන විනිමය අනුපාතිකයේ අවාසි

- වෙළෙඳ පොළ බලවේග මත විනිමය අනුපාතිකය නිතර උච්චාවචනය වන බැවින් විනිමය අනුපාතිකය පිළිබඳ අවිනිශ්චිතතාවයක් හටගැනීම.
- විනිමය අනුපාතිකයේ ඇතිවන අහිතකර උච්චාවචනය ජාත්‍යන්තර වෙළෙඳාමේ වර්ධනයට සහ ජාත්‍යන්තර ප්‍රාග්ධන සංචලන කෙරෙහි අහිතකර වීම.
- සම්ප්‍රේෂණ ක්‍රියා දිරිමත් වීම හේතුකොටගෙන විදේශ විනිමය වෙළෙඳ පොළ දැඩි අස්ථායිතාවයන්ට ගොදුරුවීම.
- විනිමය අනුපාතිකයේ ක්ෂයවීම් නිසා දේශීය උද්ධමන පීඩනය තීව්‍ර වීම.
- ණය ගණුදෙනුවල දී විනිමය අනුපාතික වෙනස්කම් වලින් එක් පාර්ශ්වයකට අවාසි වීම.

# 02.ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමය

ස්ථාවර විනිමය අනුපාත ක්‍රමය යනු මූල්‍ය අධිකාරින් විසින් දේශීය මුදල් ඒකකයක සම අගය (වටිනාකම) තීරණය කොට එම අගය නැවත වෙනස් කරන තුරු අඛණ්ඩව පවත්වාගෙන යාමේ ක්‍රමයයි

## ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමයේ වාසි

- ජාත්‍යන්තර වෙළඳාම ප්‍රවර්ධනය වීම
- අපනයන හා ආනයනකරුවන්ට අවිනිශ්චිතතාවයකින් තොරව විදේශ ගනුදෙනු වලට එළඹීමට හැකි බැවින් ජාත්‍යන්තර වෙළඳාම ප්‍රවර්ධනය වීම.
- විදේශ ආයෝජකයන්ට හිතකර බලපෑමක් ඇති කිරීම
- සම්ප්‍රේෂණ ක්‍රියා අධෛර්යමත් වීම
- විනිමය අනුපාතිකය පදනම් කොට ගෙන ඇති විය හැකි සම්ප්‍රේෂණ ක්‍රියා අධෛර්යමත් වේ

## ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමයේ වාසි

- **ගෙවුම් ශේෂය ස්වයංක්‍රීයව තුලනය වීමේ යාන්ත්‍රණයක් නොමැති වීම.**
- **විනිමය අනුපාතිකය අධි තක්සේරු වීම**
- **ආරක්ෂණවාදී ප්‍රතිපත්ති වලට යොමු වීම.**
- **විනිමය අනුපාතිකයේ සිදුවන වෙනස්කම්වල බලපෑම ප්‍රබල වීම.**
- **මූල්‍ය ප්‍රතිපත්තිය ස්වාධීනව ක්‍රියාත්මක කළ නොහැකිවීම්**

## 03. පාලිත පාවෙන විනිමය අනුපාතික ක්‍රමය

- මූල්‍ය අධිකාරීන් විසින් දේශීය මුදල් ඒකකය සඳහා ස්ථාවර විනිමය අනුපාතිකයක් තීරණය කොට එය එක්තරා පරාසයක් තුළ දෝලනය වීමට ඉඩ හැර ඇති තත්ත්වයයි.
- මෙය පූර්ණ නම්‍ය හා පූර්ණ අනම්‍ය විනිමය අනුපාතික ක්‍රම දෙකෙහි සංකලනයකි.එම පරාසය ඉක්මවා විනිමය අනුපාතිකය වෙනස් වීමට නැඹුරු වන විට මූල්‍ය අධිකාරිය විනිමය වෙළෙඳ පොලට මැදිහත්වීම් කරනු ලබයි
- මෙම ක්‍රමය යටතේ වෙළෙඳ පොළ බලවේග තුළින් විනිමය අනුපාතිකය නිදහසේ තීරණය වීමට ඉඩ නොහැර, විනිමය අනුපාතිකයේ දෝලනයන් පාලනය කිරීමට මහබැංකු විදේශීය විනිමය වෙළඳ පොළට මැදිහත් වීම් කරන බැවින් ,එය පිරිසිදු පාවීමක් නොව, අපිරිසිදු පාවීමක් ලෙසද හැඳින්වේ'

# 07. විනිමය අනුපාතිකය වෙනස්වීම හා එහි ප්‍රතිවිපාක

## විනිමය අනුපාතිකය ක්ෂය වීම

නම්‍ය විනිමය අනුපාතික ක්‍රමයක් තුළ දේශීය මුදල් ඒකකයේ විදේශ/බාහිර අගය ( දේශීය මුදල් ඒකකයක් මිලදී ගැනීමට ගෙවිය යුතුවිදේශ මුදල් ඒකක ප්‍රමාණය ) පහළ වැටීම විනිමය අනුපාතිකය ක්ෂය වීමක් ලෙස සැලකේ

## විනිමය අනුපාතිකය ක්ෂය වීමට හේතු

- විදේශ විනිමය සඳහා වන ඉල්ලුම් ස්ථාවරව තිබියදී සැපයුම අඩුවීම.
- විදේශ විනිමය සඳහා වන සැපයුම ස්ථාවරය තිබියදී ඉල්ලුම වැඩි වීම.
- විදේශ විනිමය සඳහා වන ඉල්ලූම වැඩිවීම හා සැපයුම අඩුවීම යන දෙකම සිදුවීම.
- විදේශ විනිමය සඳහා වන ඉල්ලුම අඩු වන වේගයට වඩා වැඩි වේගයකින් විදේශ විනිමය සැපයුම අඩුවීම.
- විදේශ විනිමය සඳහා වන සැපයුම වැඩි වන අනුපාතයට වඩා වැඩි අනුපාතයකින් ඉල්ලුම වැඩිවීම.

## විනිමය අනුපාතිකය ක්ෂය වීමෙහි ආර්ථික ප්‍රතිවිපාක

- මූර්ත විනිමය අනුපාතිකය ක්ෂය වුවහොත් ශුද්ධ අපනයන වැඩි කර ගැනීමට ඉඩ කඩ පවතී.එය වෙළඳ ශේෂයට යහපත් විය හැක.
- ආනයන මිල ඉහළ යාමෙන් උද්ධමනය වේගවත් වේ.
- ආනයන මිල ඉහළ යාම නිසා ආනයන මත දැඩිව රඳා පවතින නිෂ්පාදන අංශ වල පිරිවැය ඉහළ යනු ඇත.
- විදේශ ණය සේවා වියදම් ඉහළ යාම නිසා අයවැය හිඟය වැඩි වීමට ඉඩකඩ තිබේ.
- විදේශ සෘජු ආයෝජන අධෛර්යමත් වේ.

## විනිමය අනුපාතිකය ඉහළ යාම

**නම්‍ය විනිමය අනුපාතික ක්‍රමයක් යටතේ දේශීය මුදල් ඒකකයේ විදේශ/ බාහිර අගය(දේශීය මුදල් ඒකකයක් සඳහා ගෙවිය යුතු විදේශීය මුදල් ඒකක ප්‍රමාණය) ඉහළ යාම විනිමය අනුපාතිකය ඉහළ යාමක් ලෙස සැලකේ.**

## විනිමය අනුපාතිකය ඉහළ යාමට හේතු

- විදේශ විනිමය සඳහා වන ඉල්ලුම ස්ථාවරව තිබියදී සැපයුම වැඩි වීම.
- විදේශ විනිමය සඳහා වන සැපයුම ස්ථාවර තිබියදී ඉල්ලුම අඩු වීම.
- විදේශ විනිමය සඳහා වන ඉල්ලුම අඩුවීම හා සැපයුම වැඩි වීම යන දෙකම එකවර සිදුවීම.
- විදේශ විනිමය සඳහා වන ඉල්ලුම වැඩිවන වේගයට වඩා වැඩි වේගයකින් විදේශ විනිමය සැපයුම වැඩි වීම.
- විදේශ විනිමය සඳහා වන සැපයුම අඩු වන වේගයට වඩා වැඩි වේගයකින් ඉල්ලුම අඩුවීම.

## විදේශ විනිමය අනුපාතිකය ඉහළ යාමේ ආර්ථික ප්‍රතිවිපාක

- මූර්ත විනිමය අනුපාතිකය ඉහළ යාමෙන් ශුද්ධ අපනයන පහත වැටීම.
- ආනයන මිළ පහළ යාමෙන් උද්ධමනය අඩු වීම.
- ආනයන මිල පහළ යාම නිසා ආනයන මත දැඩිව රඳා පවතින නිෂ්පාදන අංශවල පිරිවැය පහළ යාම.
- විදේශ ණය සේවා වියදම් පහළ යාමෙන් අයවැය මත පීඩනය අවම වීම.
- විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය වීම.

# විදේශ විනිමය අනුපාතිකය අවප්‍රමාණය කිරීම හෝ ප්‍රතිප්‍රමාණය කිරීම

## විනිමය අනුපාතිකය අවප්‍රමාණය කිරීම

ස්ථාවර විනිමය අනුපාත ක්‍රමය යටතේ මූල්‍ය අධිකාරීන් විසින් දේශීය මුදල් ඒකකයේ සම අගය හෙවත් නිල මිල පහළ දැමීම, විනිමය අනුපාතිකය අවප්‍රමාණය කිරීමයි ගෙවුම් ශේෂයේ හිගයක්, දිගින් දිගටම පවතින විට විනිමය අනුපාතිකය අවප්‍රමාණය කිරීමට මූල්‍ය අධිකාරිය තීරණය කරයි. මෙවිට විදේශ මුදල් ඒකකයක් මිලදී ගැනීම සඳහා ගෙවිය යුතු දේශීය මුදල් ඒකක ප්‍රමාණය වැඩි වේ.

### විනිමය අනුපාතිකය අවප්‍රමාණය කිරීමට හේතු

- අපනයන තරගකාරීත්වය වැඩි කිරීමට
- විදේශ විනිමය සමපේෂණ කටයුතු සීමා කිරීමට
- ආනයන අධෛර්යමත් කිරීම තුළින් විදේශ සම්පත් ආරක්ෂාකර ගැනීමට
- ගෙවුම් ශේෂ අර්බුධ අවම කර ගැනීමට (හිගය පාලනය කිරීම)

**විනිමය අනුපාතිකය අවප්‍රමාණය කිරීමේ ආර්ථික ප්‍රතිවිපාක විනිමය අනුපාතිකය ක්ෂය වීමේ ආර්ථික ප්‍රතිවිපාක වලට සමාන වේ.**

## විනිමය අනුපාතිකය අවප්‍රමාණය කිරීමේ සඵලතාවය තීරණය කරන සාධක

- අපනයන ඉල්ලුම නම්‍ය විය යුතුය.
- ආනයන ඉල්ලුම නම්‍ය විය යුතුය.
- අපනයන හා ආනයන නම්‍යතාවයන් හි ඒකාබද්ධ මිල නම්‍යතාව 1 ට වඩා වැඩි විය යුතුය.

  (මාර්ෂල් ලර්නර් කොන්දේසිය.)
- අපනයන සැපයුම නම්‍ය විය යුතුය.
- දේශීය මිල උද්ධමනය වළකා ගත යුතුය.
- ආනයන ආදේශන කර්මාන්ත රටතුළ පැවතීම.
- තරගකාරී වෙනත් රටවල් මුදල් අවප්‍රමාණය නොකළ යුතුය.

## මාර්ෂල් ලර්නර් කොන්දේසි

විනිමය අනුපාතිකය අවප්‍රමාණය කිරීම හෝ ක්ෂයවීම හේතුවෙන් ආනයනය සහ අපනයන සම්බන්ධයෙන් ඇතිවියහැකි තත්වයන් සැලකිල්ලට ගෙන එම තත්ත්වය වෙළෙඳ ශේෂය කෙරෙහි බලපාන ආකාරය සලකා බැලීමට මාර්ෂල් ලර්නර් කොන්දේසි ඉදිරිපත් කර ඇත.

- **ex+em>1** - එකට වඩා වැඩි නම් **වෙළෙඳ ශේෂය වාසිදායක වේ**
- **ex+em=1** - එකට සමාන නම් **වෙළෙඳ ශේෂය වෙනස් නොවේ**
- **ex+em<1** - එකට අඩු නම් **වෙළෙඳ ශේෂය අවාසිදායක වේ.**

## විනිමය අනුපාතිකය ප්‍රතිප්‍රමාණය (අධි ප්‍රමාණය) කිරීම.

ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමය යටතේ මූල්‍ය අධිකාරිය විසින් දේශීය මුදල් ඒකකයේ සම අගය හෙවත් නිල මිල ඉහළ දැමීම විනිමය අනුපාතිකය ප්‍රතිප්‍රමාණය කිරීමයි.මෙහිදී විදේශීය මුදල් ඒකකයක් මිල දී ගැනීම සඳහා ගෙවිය යුතු දේශීය මුදල් ඒකක ප්‍රමාණ අඩු වේ.ගෙවුම් ශේෂයේ අතිරික්තයක් දිගින් දිගටම පවතින විට විනිමය අනුපාතිකය ප්‍රතිප්‍රමාණය කිරීමට මූල්‍ය අධිකාරිය තීරණය කරයි.

## විනිමය අනුපාතිකය ප්‍රතිප්‍රමාණය කිරීමට හේතු

- උද්ධමනය පාලනය කිරීම සඳහා
- දේශීය නිෂ්පාදන පිරිවැය අඩු කර ගැනීම සඳහා
- ගෙවුම් ශේෂයේ පවතින අතිරික්තයන් මගහරවා ගැනීම සඳහා

**විනිමය අනුපාතික ප්‍රතිප්‍රමාණය කිරීමේ ආර්ථික ප්‍රතිවිපාක ද, විනිමය අන්පාතිකය ඉහළ යාමේ ආර්ථික ප්‍රතිවිපාක වලට සමාන වේ.**

# විනිමය අනුපාතිකය අධිතක්සේරු වීම හෝ ඌනතක්සේරු වීම.

## විනිමය අනුපාතිකය අධිතක්සේරු වීම

විනිමය අනුපාතිකය අධිතක්සේරු වීම යනු,කිසියම් රටක විනිමය අනුපාතය (දේශීය මුදල් ඒකකයේ විදේශ අගය)සත්‍ය ලෙස පැවතිය යුතු මට්ටමට වඩා ඉහළ මට්ටමක තීරණය වී තිබීමයි.

### විනිමය අනුපාතිකය අධි තක්සේරු වීම වැළැක්වීමට රජයකට ගත හැකි ක්‍රියාමාර්ග

- විදේශ විනිමය සැපයුම වැඩි කිරීම.
- විනිමය අනුපාතිකය අවප්‍රමාණය කිරීම.
- විදේශ විනිමය ඉල්ලුම සෘජුවම අඩුකිරීමට පියවර ගැනීම.
- වක්‍ර ලෙස විදේශ විනිමය ඉල්ලුම අඩු කිරීම.
- උදා:සංකෝචනාත්මක මූල්‍ය හා පිස්කල් ප්‍රතිපත්ති

## විනිමය අනුපාතිකය ඌන තක්සේරු වීම.

විනිමය අනුපාතිකය ඌන තක්සේරු වීම යන්නෙන් අදහස් වන්නේ ,කිසියම් රටක විනිමය අනුපාතිකය (දේශීය මුදල් ඒකකයේ විදේශ අගය)සත්‍ය ලෙස පැවතිය යුතු මට්ටමට වඩා පහළ මට්ටමක තීරණය වී තිබීමයි.

# විදේශ විනිමය අනුපාතිකයේ වෙනස්වීම් මිනුම් කිරීම

## 01. නාමික විනිමය අනුපාතිකය

එක් මුදල් වර්ගයක මිල තවත් මුදල් වර්ගයකින් ප්‍රකාශ කිරීම නාමික විනිමය අනුපාතයයි. මිල නිර්ණය කිරීමේ ක්‍රමයට හෝ පරිමාව නිර්ණය කිරීමේ ක්‍රමයට දක්වන්නේ මෙයයි

උදා :එක්සත් ජනපද ඩොලර් 1 - රු.460.40

## 02. මූර්ත විනිමය අනුපාතිකය

මූර්ත විනිමය අනුපාතිකය යනු රටවල් 02 ක් අතර පවත්නා මිල මට්ටම්වල වෙනස් වීම ගලපන ලද නාමික විනිමය අනුපාතිකයයි.

$$\text{මූර්ත විනිමය අනුපාතිකය} = \text{නාමික විනිමය අනුපාතිකය} \times \frac{\text{දේශිය මිල මට්ටම}}{\text{විදේශිය රටේ මිල මට්ටම}}$$

## 03. නාමික සඵල විනිමය අනුපාතිකය

නාමික සඵල විනිමය අනුපාතිකය යනු,යම් රටක ප්‍රධාන වෙළෙඳ තරගකරුවන්ගේ හා හවුල්කරුවන්ගේ නාමික විනිමය අනුපාතිකයන්හි බර තබන ලද සාමාන්‍යයි. බර ප්‍රමාණය ,මුදල් පැසට ඇතුළත් එක් එක් රට සමග සිදුකරන වෙළෙඳාමේ වැදගත්කම මත පදනම් වේ.

### නාමික සඵල විනිමය අනුපාතිකය ගණනය කරන ආකාර දෙකකි.

- මුදල් වර්ග පහකින් සැදුම්ලත් පැසමත පදනම් වූ නාමික සඵල විනිමය අනුපාතිකය. (එක්සත් ජනපද ඩොලරය,ස්ටර්ලිං පවුම,ජපන් යෙන්,යූරෝ ඉන්දියානු රුපියල)
- වෙළෙඳ හවුල්කරුවන්ගේ සහ තරගකරුවන්ගේ මුදල් වර්ග 24 කින් සැදුම්ලත් පැසමත පදනම් වන නාමික සඵල විනිමය අනුපාතිකය.

## 04. මූර්ත සඵල විනිමය අනුපාතිකය

නාමික සඵල විනිමය අනුපාතිකයට ,දේශීය හා විදේශීය වෙළෙඳ හවුල්කරුවන්ගේ හා තරගකරුවන්ගේ උද්ධමන අනුපාතික අතර වෙනස ගැලපූ විට මූර්ත සඵල විනිමය අනුපාතිකය ලැබේ.

## 05. ක්‍රය ශක්ති සාම්‍ය විනිමය අනුපාතිකය

ක්‍රය ශක්ති සාම්‍ය විනිමය අනුපාතිකය යනු සමාන භාණ්ඩ පැසක වටිනාකම, රටවල් 2 ක මුදල් ඒකක වලින් මනිනු ලැබුවහොත් එම අගයන් දෙක අතර පවතින අනුපාතිකයයි. මෙමගින් පෙන්වා දෙන්නේ විනිමය අනුපාතිකය,විවිධ ව්‍යවහාර මුදල් වර්ග අතර ක්‍රය ශක්තීන් සමාන කෙරෙන්නක් විය යුතු බවයි.

# 08. බහු පාර්ශවීය මූල්‍ය ආයතන වල කාර්ය

## ජත්‍යන්තර මූල්‍ය අරමුදල

බ්‍රෙට්වත්වුඩ්ස් සම්මුතිය යටතේ 1945 දී නිර්මාණය කරන ලද 1947 දි රටවල් 29 කින් තම ව්‍යාපාර කටයුතු ආරම්භකල දනට රටවල් 188 ක් සමාජිකත්වය දරණ ආයතනයකි.

## ජත්‍යන්තර මූල්‍ය අරමුදලේ අරමුණු

- ජත්‍යන්තර සහයෝගිතාව වර්ධනය සඳහා ස්ථාවර ආයතනයක අවශ්‍යතාව ඉටු කිරීම
- සමාජික රටවල ගෙවුම් ශේෂ දුෂ්කරතා වලක්වාලීමට අවශ්‍ය කෙටිකාලීන මූල්‍ය පහසුකම් සැපයීම
- අන්තර්ජාතික වෙළෙඳ බාධක ඉවත් කොට සමාජික රටවල් අතර බහු පාර්ශවිය ගෙවීම් ක්‍රමයක් පිහිටුවීම
- ජත්‍යන්තර වශයෙන් විනිමය අනුපාතිකයන්හි තිරසාර භාවය ඉටු කිරීම
- ගෙවුම් ශේෂයේ ගැලපුම් ඇතිකරගැනීමට අවශ්‍ය අතරමුදල් සැපයීම

## ජත්‍යන්තර මූල්‍ය අරමුදලේ කාර්යයන්

- අර්බුධකාරී තත්ත්වයන් හටගැනීම වලක්වා ලීමට සමාජික රටවලට උපදෙස්දම
- මහ බැංකු නිළධාරින් පුහුණු කිරීම හා අදාළ ක්ෂෙත්‍රවල දැනුම ලබාදීම
- ආර්ථික ක්ෂෙත්‍රයන්ට අදාල ප්‍රමිති සකස්කරිම
- ආර්ථික ප්‍රතිසංස්කරණ ඇති කොට විසඳුම් ලබාදීම
- ගුණාත්මක බැංකු හා මූල්‍ය කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය උපදෙස් දීම

## ලෝක බැංකුව

ලෝක බැංකුව 1944 ජූලි 25 වන දින ආරම්භ කරන ලදී. දෙවන ලෝක යුද්ධයෙන් විනාශයට පත් වූ යුරෝපයේ පුනරුත්ථාපන කටයුතු මූල්‍යනය කිරීමේ අරමුණින් බ්‍රෙට්න් වුඩ්ස් සම්මේලනය මගින් පිහිටවූ ආයතනයයි. වර්තමානයේ මෙහි සාමාජික සංඛ්‍යාව රටවල් 188 කි. මෙය ප්‍රධාන ආයතන හතරකින් සමන්විත වෙයි.

- ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර බැංකුව.
- ජාත්‍යන්තර සංවර්ධන සමායතනය
- බහුපාර්ශවික ආයෝජනය ඇපකර නියෝජිත ආයතනය (මිගා)
- ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා ආයතනය

## ලෝක බැංකුවේ මූලික පරමාර්ථ

- කාර්මික සහ ශිල්පීය උපදෙස් සේවා ලබාදීම
- නිෂ්පාදන කටයුතුවලට අවශ්‍ය ආයෝජන පහසුකම් සැපයීම මගින් සංවර්ධනය වේගවත් කිරීම
- ලිහිල් කොන්දේසි යටතේ විදේශීය ප්‍රාග්ධන පහසුකම් නොලැබෙන විටදී විදේශ පෞද්ගලික ආයෝජන පහසුකම් දිරිගැන්වීම හා අවස්ථා ඇති කිරීම.
- පෞද්ගලික ආයෝජන වලට අමතරව ලෝක බැංකුවේ අරමුදල් සහ වෙනත් අරමුදල් මාර්ගයක් භාවිතා කර ඵලදායි නිෂ්පාදන කටයුතු සඳහා දිගු කාලීන ණය සැපයීම.
- නිෂ්පාදන සම්පත් වර්ධනය කර ගැනීම සඳහා අන්තර්ජාතික ආයෝජන දිරි ගැන්වීම තුළින් ජාත්‍යන්තර වෙළෙඳාමේ සමබර සංවර්ධනයක් අත්කර දීම.